# අ.පො.ස.(සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

**ඉතිහාසය I** | පැය එකයි

සැලකිය යුතුයි :

- * **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **80**ක් හිමි වේ.
- * අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරන්න.

**1.** අතීතයේ දී අරාබි ජාතිකයන් ශ්‍රී ලංකාව හඳුන්වා ඇත්තේ කුමන නමින් ද?
(1) සීලැන් (2) තැප්‍රොබානා (3) සෙරන්ඩිබ් (4) තම්බපන්ණි

**2.** පහත ප්‍රකාශ සලකන්න.
*A* - කෝට්ටේ යුගයේ සිට මහනුවර අවධිය තෙක් ශාසන ඉතිහාසය ගැන තොරතුරු නිකාය සංග්‍රහයේ ඇතුළත් වේ.
*B* - විජය රජුගේ සිට මහසෙන් රජතුමා දක්වා තොරතුරු දීප වංශයේ දැක්වේ.
*C* - දුටුගැමුණු රජු, එළාර රජු පරාජය කිරීම ගැන තොරතුරු මහා වංශයේ සඳහන් වේ.
*D* - ලංකාවට බුදුදහම ගෙන ඒම පිළිබඳ තොරතුරු සමන්ත පාසාදිකාවෙහි ඇතුළත් වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) *A B C* ය. (2) *A B D* ය. (3) *A C D* ය. (4) *B C D* ය.

- **දී ඇති සිතියම අධ්‍යයනය කොට 3 සහ 4 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




**3.** සිතියමෙහි "*A*" අක්ෂරයෙන් දැක්වෙන නදියෙහි පැරණි නාමය මින් කුමක් ද?
(1) ජජ්ජර
(2) මහාවාලුකා
(3) කදම්බ
(4) කප්ප කන්දර

**4.** පොළොන්නරු යුගයේ ප්‍රාදේශීය පාලන ඒකකයක් වූ අට දහස් රට දැක්වෙන්නේ සිතියමේ කුමන අක්ෂරයෙන් දැක්වෙන ප්‍රදේශය ද?
(1) *P*
(2) *Q*
(3) *R*
(4) *S*

**5.** ප්‍රථමවරට ඉන්දීය ආක්‍රමණයකට මුහුණ දීමට සිදු වූ ශ්‍රී ලංකාවේ රජතුමා වන්නේ,
(1) සූරතිස්ස ය. (2) අසේල ය. (3) උත්තිය ය. (4) වළගම්බා ය.

**6.** තැනිතලා ප්‍රදේශවල වැව් තනා තිබීම පිළිබඳ දියහැකි හොඳම නිදසුන මින් කුමක් ද?
(1) ගිරිතලේ වැව (2) කලා වැව (3) හිරිවඩුන්න වැව (4) යෝධ වැව

**7.** ඓතිහාසික සිදුවීම් කිහිපයක් පහත දැක්වේ.
*A* - පළමුවන රාජේන්ද්‍ර, රුහුණ ආක්‍රමණය කොට පස්වන මිහිඳු රජු සිරකරුවකු ලෙස පැහැරගෙන යාම
*B* - දකුණු ඉන්දීය ආක්‍රමණිකයෙක් වූ එළාර, අසේල රජු පරාජය කර රාජ්‍ය පැහැර ගැනීම
*C* - වළගම්බා රජු සමයේ දකුණු ඉන්දියානු ආක්‍රමණිකයන් දෙදෙනකු පාත්‍රා ධාතුව හා සෝමා දේවිය පැහැරගෙන යාම
*D* - සූරතිස්ස රජු දවස සේන ගුත්තික අස් වෙළෙඳුන් අනුරාධපුරය යටත් කර ගැනීම
ඉහත සඳහන් සිදුවීම් ඓතිහාසික අනුපිළිවෙළට ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.
(1) *B C D A* (2) *D B C A* (3) *D B A C* (4) *D C A B*

**8.** පුරා විද්‍යාත්මක කැණීම් සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

*A* - රත්නපුර ප්‍රදේශයෙන් තිරුවානා හා කහඟ පාෂාණවලින් සාදන ලද ගල් මෙවලම් හමු වීම
*B* - ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳ අවශේෂ, පාහියන් ලෙන තුළින් හමු වීම
*C* - පොම්පරිප්පු කැණීම්වලදී මෙගලිතික් සුසාන භූමියෙන් ජ්‍යාමිතික ක්ෂුද්‍ර මෙවලම් හමු වීම
*D* - බටදොඹලෙන කැණීම්වලින් මුහුදු බෙලි කටු හමු වීම නිසා වෙරළබඩ ප්‍රදේශ අතර සබඳතා පැවැති බව අනාවරණය වීම

ප්‍රාග් ඓතිහාසික තොරතුරු නිවැරදිව දැක්වෙන කාණ්ඩය තෝරන්න.

(1) *A B C* (2) *A B D* (3) *A C D* (4) *B C D*

**9.** මහායානික ඇදහීමක් වන අවලෝකිතේශ්වර බෝධිසත්ව වන්දනය පිළිබඳ වැදගත් සාක්ෂි ලැබෙන ස්ථානයක් වන්නේ,

(1) කුෂ්ඨරාජ ගල ය. (2) චිත්තල පබ්බත ය.
(3) පොළොන්නරු ගල් විහාරය ය. (4) තන්තිරිමලේ ය.

**10.** පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට ආසන්න ම හේතුව වන්නේ,

(1) චන්ද්‍රභානු ආක්‍රමණය ය. (2) ආර්ථික පරිහානිය ය.
(3) අයහපත් විදේශ ප්‍රතිපත්තිය ය. (4) කාලිංග මාඝ ආක්‍රමණය ය.

**11.** කෝට්ටේ යුගයට අයත් සාහිත්‍ය ග්‍රන්ථ පමණක් අයත් පිළිතුර කුමක් ද?

(1) පරවි සංදේශය, ගිරා සංදේශය, තිසර සංදේශය, ගුත්තිල කාව්‍යය
(2) බුදුගුණ අලංකාරය, කාව්‍යශේඛරය, පැරකුම්බා සිරිත, මයූර සංදේශය
(3) මයූර සංදේශය, ගුත්තිල කාව්‍යය, පරවි සංදේශය, කාව්‍යශේඛරය
(4) පරවි සංදේශය, ගිරා සංදේශය, පැරකුම්බා සිරිත, ගුත්තිල කාව්‍යය

**12.** පහත සඳහන් කරුණු සලකන්න.

*A* - දඹදෙණි විජේසුන්දරාරාම විහාරය කරවීම
*B* - කව් සිළුමිණ හා විශුද්ධි මාර්ග සන්නය රචනා කිරීම
*C* - චන්ද්‍රභානු ආක්‍රමණය පරාජය කිරීම
*D* - බෙලිගල දළදා මාළිගය ඉදි කරවීම
*E* - දඹදෙණි කතිකාවත සම්පාදනය

තුන්වන විජයබාහු රජතුමා හා සම්බන්ධ සිද්ධි ඇතුළත් වරණය තෝරන්න.

(1) *A D* (2) *B E* (3) *C D* (4) *C E*

**13.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

*A* - ගම්පොළ රාජධානි සමයේ අලකේශ්වර හා සේනාධිලංකාර පවුල් දෙක ප්‍රබලව පැවතුණි.
*B* - අභ්‍යන්තර වෙළෙඳාම හා සම්බන්ධ කඩවීදි ගැන ''කුරුණෑගල විස්තරය'' නම් පුස්කොළ පොතේ සඳහන් වේ.
*C* - විජය නගර් රාජ්‍යයේ දෙවන හරිහර රජු ලංකාව ආක්‍රමණය කළ බව ආලම්පූරි සන්නසෙහි සඳහන් වේ.
*D* - නිශ්ශංක අලගක්කෝණාර සෙන්පතියා සීතාවක රාජධානියේ බලකොටුවක් ඉදි කළේ ය.

නිවැරදි ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) *A B C* (2) *A B D* (3) *A C D* (4) *B C D*

**14.** උඩරට රජවරුන් ලන්දේසීන් සමඟ අත්සන් කළ ගිවිසුම් දෙකක ඇතුළත් වගන්ති කිහිපයක් පහත දැක්වේ.

*A* - පෘතුගීසීන් පළවා හැරීමට ලන්දේසීන් රජුට උදව් කිරීම
*B* - මුහුදු බඩ ගව්වක් පමණ බිම් තීරුවක් ලන්දේසීන්ට පැවරීම
*C* - කොළඹ, ගාල්ල, මාතර හා යාපනය දිශාවන් ලන්දේසීන්ට පැවරීම
*D* - යුද්ධය සඳහා යන වියදම් රජු විසින් දැරීම

ක්‍රි.ව. 1766 ගිවිසුමේ ඇතුළත් කොන්දේසි වන්නේ,

(1) *A* හා *B* ය. (2) *A* හා *D* ය. (3) *B* හා *C* ය. (4) *C* හා *D* ය.

**15.** උඩරට රාජ්‍යයේ ප්‍රථම නායක්කර් වංශික රජතුමා වන්නේ,

(1) රාජාධි රාජසිංහ ය. (2) කීර්ති ශ්‍රී රාජසිංහ ය.
(3) ශ්‍රී විජය රාජසිංහ ය. (4) ශ්‍රී වික්‍රම රාජසිංහ ය.

**16.** ලංකාවේ විදේශීය පාලන සමයට අයත් සිදුවීම් කිහිපයක් පහත දැක්වේ.

*A* - ජොරිස් ෆන් ස්පිල්බර්ජන් පළමුවන විමලධර්මසූරිය රජු කන්ද උඩරට දී හමු වීම.
*B* - කීර්ති ශ්‍රී රාජසිංහ රජු සමග ක්‍රි.ව. 1766 දී ගිවිසුමක් ඇතිකර ගැනීම.
*C* - සියම් රටින් උපසම්පදා භික්ෂූන් වහන්සේලා උඩරටට වැඩම කරවීමට නාවික ආධාර ලබා දීම.
*D* - දකුණු ඉන්දියාවෙන් නායක්කාර් වංශික බිසෝවරු ගෙන්වා දීමට කටයුතු කිරීම.

ලන්දේසි පාලන සමයට පමණක් අයත් සිදුවීම් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) *A B C* (2) *A B D* (3) *A C D* (4) *B C D*

**17.** විසිවන සියවසේ මුල් කාලයේ නාගරික හා වතු කම්කරුවන් වෘත්තීය අයිතිවාසිකම් දිනාගැනීම සඳහා මෙහෙය වූ නායකයන් දෙදෙනකු වන්නේ,

(1) ඒ.ඊ. ගුණසිංහ හා ඇන්.ඇම්. පෙරේරා ය. (2) ඇන්.ඇම්. පෙරේරා හා පිලිප් ගුණවර්ධන ය.
(3) පිලිප් ගුණවර්ධන හා නඩේසන් අයියර් ය. (4) නඩේසන් අයියර් හා ඒ.ඊ. ගුණසිංහ ය.

**18.** සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ලංකාවේ අග්‍රාණ්ඩුකාරවරයා පත්කරනු ලබන්නේ,

(1) ජනාධිපති විසින් ය. (2) අගමැති විසින් ය.
(3) බ්‍රිතාන්‍ය රැජින විසින් ය. (4) ආණ්ඩුකාරවරයා විසින් ය.

**19.** ජනතාව මහත් පීඩාවට පත්කළ සුනඛ බද්ද (බලු බද්ද), ඇඟ බද්ද වැනි අසාධාරණ බදු සමූහයක් පැනවූ ආණ්ඩුකාරවරයා වන්නේ,

(1) ෆන් එංගල් බෙක් ය. (2) ටොරිංටන් ය. (3) විලියම් ග්‍රෙගරි ය. (4) ෆෙඩ්රික් නෝත් ය.

**20.** ප්‍රථම වරට උගත් ලාංකිකයන් වෙනුවෙන් ව්‍යවස්ථාදායක සභාවට පොන්නම්බලම් රාමනාදන් මහතා තේරී පත්වන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ,

(1) කෲව් මැකලම් ය. (2) මැනිං ය. (3) මැනිං-ඩෙවොන්ෂයර් ය. (4) ඩොනමෝර් ය.

**21.** ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන මැතිවරණ ක්‍රමයේ, ''ජනමත විචාරණයක'' දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණය මින් කුමක් ද?

(1) ඡන්ද අපේක්ෂකයෝ දිස්ත්‍රික්ක පදනම මත කණ්ඩායමක් වශයෙන් ඉදිරිපත් වීම
(2) ජයග්‍රාහී පක්ෂවලට බෝනස් ආසන ලබා දීම
(3) ඡන්දයේ දී තමා කැමති අපේක්ෂකයාට හිමි මනාපය, අංකයකට ලබා දීම
(4) ඡන්දයේ දී තම අභිමතය 'ඔව්' හෝ 'නැත' ලෙස ප්‍රකාශ කිරීම

**22.** පහත කරුණු සලකන්න.

*A* - පළාත් බද නියෝජන ක්‍රමය පුළුල් වීම
*B* - ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව
*C* - අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය
*D* - විධායක කාරක සභා ක්‍රමය
*E* - සර්ව ජන ඡන්ද බලය ලැබීම
*F* - රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පිහිටුවීම

ඉහත දක්වා ඇති කරුණු අතරින් ඩොනමෝර් ආණ්ඩුක්‍රම යෝජනා ඇතුළත් වරණය තෝරන්න.

(1) *A B D* (2) *A D E* (3) *B C F* (4) *B D E*

**23.** දේශීය සමුද්‍ර තීරයේ ගුවනේ දී සිදුකළ කිසියම් සිදුවීමක් වෙනුවෙන් ඔබට නඩුවක් පැවරීමට අවශ්‍යතාවක් ඇති වුවහොත්, ඔබ සාධාරණය ඉටු කර ගැනීම සඳහා යා යුතු අධිකරණය කුමක් ද?

(1) ප්‍රාථමික අධිකරණය (2) දිසා අධිකරණය
(3) මහා අධිකරණය (4) මහේස්ත්‍රාත් අධිකරණය

**24.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක මූලික ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

(i) ''ලංකා'' නාමයෙන් හැඳින් වූ අපේ රට ශ්‍රී ලංකා යන නාමය ලැබීම
(ii) සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් වීම
(iii) ජනතාවට පරමාධිපත්‍ය බලය පැවරීම
(iv) බෞද්ධාගමට ප්‍රමුඛස්ථානයක් ලබා දීම

ඉහත සඳහන් කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ ලෙස හඳුන්වා දෙන්නේ කුමන වර්ෂයේ දී ද?

(1) 1947 (2) 1948 (3) 1972 (4) 1978

[4 වැනි පිටුව බලන්න

**25.** පහත කරුණු සලකන්න.

*A* - බ්‍රහ්මදත්ත රජු සමඟ සටන්කොට අංග රාජ්‍ය අල්ලා ගැනීම
*B* - පළාත් පාලනය රජ පවුලේ කුමාරවරුන් හෝ අමාත්‍යවරුන් විසින් සිදු කිරීම
*C* - පාලනයේ දී රජුට සහය වීමට මන්ත්‍රී මණ්ඩලයක් සිටීම
*D* - කෝසල රජුගේ සොහොයුරිය විවාහ කර ගැනීම

බිම්බිසාර රජුට පමණක් අදාළ වන කරුණු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) *A B* (2) *A D* (3) *B C* (4) *C D*

**26.** දිල්ලි සුල්තාන් රාජ්‍යයේ අවසාන රාජ වංශය කුමක් ද?

(1) සෙයියදු (2) ලෝදි (3) මෝගල් (4) වහල්

**27.** ඉන්දියාවේ මුස්ලිම් බලය පිහිටුවීමේ දී මුස්ලිම්වරුන් විසින් ප්‍රථමයෙන් ම අල්ලා ගත් ස්ථාන දෙක කුමක් ද?

(1) කාශ්මීරය සහ සින්ධ් (2) දිල්ලි සහ පන්ජාබය (3) බෝලාන් සහ ඛයිබර් (4) සින්ධ් සහ මුල්තාන්

**28.** එංගලන්තයේ ජාතික රාජ්‍යයේ ආරම්භකයා වන්නේ,

(1) ෆර්ඩිනන්ඩ් රජු ය. (2) හතරවන හෙන්රි රජු ය.
(3) එළිසබෙත් රැජින ය. (4) හත්වන හෙන්රි රජු ය.

**29.** පුනරුද සමයේ දේශගවේෂණවල යෙදුනු නාවිකයන්ට, සුරක්ෂිත බව තහවුරු කර ගැනීම සඳහා පහත දැක්වෙන කුමන උපකරණ ආයකවී ද?

(1) දුරේක්ෂය සහ මාලිමා යන්ත්‍රය (2) මාලිමා යන්ත්‍රය සහ උතුරුතරු මාපකය
(3) උතුරුතරු මාපකය සහ වාෂ්ප එන්ජිම (4) වාෂ්ප එන්ජිම සහ මාලිමා යන්ත්‍රය

**30.** දේශගවේෂණ සඳහා අනුග්‍රහය ලබා දුන් පුද්ගලයින් **I** තීරුවෙන් දැක්වේ. ඔවුන්ගේ රටවල් **II** තීරුවෙන් දැක්වේ.

| **I තීරුව** | **II තීරුව** |
|---|---|
| (i) හෙන්රි හඩ්සන් | *A.* මහා බ්‍රිතාන්‍යය |
| (ii) පර්ඩිනන්ඩ් රජු සහ ඉසබෙලා බිසව | *B.* ස්පාඤ්ඤය |
| (iii) පළමුවන එළිසබෙත් රැජින | *C.* ප්‍රංශය |
| (iv) නාවුක හෙන්රි රජු | *D.* පෘතුගාලය |
| | *E.* ඕලන්දය |

**I** තීරුව අනුව, **II** තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

(1) *B A C D* (2) *C D E A* (3) *E B A D* (4) *D B A E*

**31.** දේශගවේෂකයින් **I** තීරුවේ ද ඔවුන් සොයා ගත් රටවල්, **II** තීරුවේ ද දැක්වේ.

| **I තීරුව** | **II තීරුව** |
|---|---|
| (i) කැබෙ සහෝදරයෝ | *A.* පිලිපීනය |
| (ii) ක්‍රිස්ටෝපර් කොලොම්බස් | *B.* කැනඩාව |
| (iii) ෆර්ඩිනන්ඩ් මැගලන් | *C.* බ්‍රසීලය |
| (iv) වස්කෝද ගාමා | *D.* හිස්පැණියෝලාව |
| | *E.* ඉන්දියාව |

**I** තීරුව අනුව **II** තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

(1) *B D E C* (2) *B C D A* (3) *B D A E* (4) *C D B E*

**32.** කාර්මික විප්ලව යුගයේ නව නිමැවුම් කිහිපයක් පහත දැක්වේ.

*A* - ස්පිනිංජෙනී
*B* - ආරක්ෂක ලාම්පුව
*C* - ජල රාමුව
*D* - වාෂ්ප එන්ජිම

පේෂ කර්මාන්තයේ දියුණුවට ඉවහල් වූ නිමැවුම් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) *A C* (2) *A D* (3) *B C* (4) *C D*

**33.** කාර්මික විප්ලවය නිසා ආර්ථික ක්ෂේත්‍රයේ සිදු වූ වැදගත් ම සිදුවීම මින් කුමක් ද?

(1) කාර්මික නිෂ්පාදනය පුළුල් වීම නිසා ආනයන අපනයන වෙළෙඳ රටාවක් බිහි වීම ය.
(2) මුදල් ආයෝජනය කළ ධනපති පන්තියක් හා ශ්‍රමය විකුණා ජීවත්වන නිර්ධන පන්තියක් බිහි වීම ය.
(3) කම්හල්වල සේවය සඳහා නගරයට කේන්ද්‍රගත වූ ශ්‍රමිකයන් නිසා ජනාකීර්ණ නගර බිහි වීම ය.
(4) වෙළෙඳ කටයුතු පුළුල් වීම නිසා ව්‍යාපාර සංවිධාන බිහි වීම ය.

**34.** දේශපාලන සිදුවීම් කිහිපයක් පහත දැක්වේ.

(i) දිගින් දිගට ම රාජාණ්ඩුක්‍රමයක් පැවතීම
(ii) ''රාජ්‍යය නම් මම ය'' යනුවෙන් බලය කේන්ද්‍රගත කර ගැනීම
(iii) මහජන නියෝජිත ආයතනය වූ ''ස්ටේට් ජනරල් සභාව'' නොසලකා හැරීම
(iv) මාරි ඇන්ටෝනියෝ රැජින පාලනයට මැදිහත් වීම

මෙම දේශපාලන සිදුවීම් හේතුකොට ගෙන

(1) ඉංග්‍රීසි විප්ලවය ඇති විය.
(2) ඇමරිකානු නිදහස් සටන ඇති විය.
(3) රුසියන් විප්ලවය ඇති විය.
(4) ප්‍රංශ විප්ලවය ඇති විය.

**35.** මහත්මා ගාන්ධිතුමා විසින් මෙහෙය වූ සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරයේ වැදගත් අවස්ථාවක් වූයේ,

(1) දණ්ඩි පා ගමන ය.
(2) ''ඉන්දියාවෙන් ඉවත් වෙනු'' ව්‍යාපාරය දියත් කිරීම ය.
(3) සත්‍යග්‍රහ ව්‍යාපාර පැවැත්වීම ය.
(4) ස්වරාජ්‍ය පක්ෂය පිහිටුවා ගැනීම ය.

**36.** ඉන්දියාවේ ශක්තිමත් වෙමින් පැවති ජාතික ව්‍යාපාරය විනාශ කිරීමට බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ ප්‍රධාන උපක්‍රමයක් වූයේ,

(1) කුල භේදය විටින් විට ඇවිස්සීම ය.
(2) කොංග්‍රස් පක්ෂය ගෙන්වා වටමේස සාකච්ඡා පැවැත්වීම ය.
(3) මුස්ලිම් ලීගය පිහිටුවීමට අනුබල දීම ය.
(4) ගාන්ධිතුමා සිරභාරයට ගැනීම ය.

**37.** ඉන්දියාවේ මුස්ලිම් ජනයා සඳහා වෙනම නිජබිමක් පිළිබඳ සංකල්පය මුලින් ම ඉදිරිපත් කරන ලද්දේ,

(1) සර් සයිද් ඛාන් ය.
(2) මොහොමඩ් ඉක්බාල් ය.
(3) මොහොමඩ් අලි ජින්නා ය.
(4) මුජිබර් රහුමාන් ය.

**38.** යාබද රූපයේ දැක්වෙන ඉන්දියානු ජන නායකයා



(1) දඩාභායි නඕරෝජි ය.
(2) ගෝපාල් ක්‍රිෂ්ණා ගෝඛාලේ ය.
(3) සුරේන්ද්‍ර නාත් බැනර්ජි ය.
(4) ලාලා ලජ්පත් රායි ය.

**39.** පළමු ලෝක සංග්‍රාමයේ දී මිත්‍ර පිල නියෝජනය කළ රටවල් කාණ්ඩය ඇතුළත් වරණය කුමක් ද?

(1) මහා බ්‍රිතාන්‍යය, රුසියාව, බල්ගේරියාව සහ තුර්කිය
(2) මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ඇමරිකා එක්සත් ජනපදය සහ ඔස්ට්‍රියාව
(3) මහා බ්‍රිතාන්‍යය , ප්‍රංශය, රුසියාව සහ ඇමරිකා එක්සත් ජනපදය
(4) රුසියාව, ඇමරිකා එක්සත් ජනපදය, ජර්මනිය සහ ඔස්ට්‍රියාව

**40.** යුරෝපීය පාලකයකුගේ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

(i) ''දුඹුරු කමිස හමුදාවක්'' පවත්වාගෙන යාම
(ii) අනන්‍යතාව තහවුරු කිරීමට ස්වස්තික ලාංඡනය පැළඳ සිටීම
(iii) ආඥාදායක පාලන ක්‍රමයක් අනුගමනය කිරීම
(iv) ''මගේ සටන'' කෘතිය රචනා කිරීම

මෙම ක්‍රියාකාරකම් හා සම්බන්ධවන පාලකයා වන්නේ,

(1) දාහතරවන ලුවී රජු ය.
(2) ඇඩොල්ෆ් හිට්ලර් ය.
(3) බෙනිටෝ මුසෝලිනි ය.
(4) ඔටෝවොන් බිස්මාක් ය.

***

## අ.පො.ස.(සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

**ඉතිහාසය II** | පැය තුනයි

සැලකිය යුතුයි :
* I කොටසේ පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
* II කොටසින් ප්‍රශ්න **තුනකට** ද III කොටසින් ප්‍රශ්න **දෙකකට** ද පිළිතුරු සපයන්න.

## I කොටස

1. **(අ)** පහත **(i)** යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම**, සපයා ඇති **ශ්‍රී ලංකා** සිතියමෙහි ද **(ii)** යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම**, සපයා ඇති **ලෝක** සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

**(i)** කන්තලේ වැව, ගෝණ නදී, ලංකා පටුන, මහාගාම, කෝට නගර, සීතාවක, පඬුවස්නුවර, කැලණිය, ගාලු වරාය, නල්ලූර් කෝවිල (ලකුණු 10යි)

**(ii)** ගෝදාවරී ගඟ, සුමාත්‍රා, තාම්‍රලිප්ති, ජිනෝවා, මධ්‍යධරණී මුහුද, පීකිං (බීජිං), ඒඩන් වරාය, ප්‍රංශය (ලකුණු 08යි)

**(ආ) (i)** පහත *A, B, C, D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින්ගේ නම් අනුපිළිවෙළින් සඳහන් කරන්න.

*A* - නගර ගුත්තික තනතුරක් මුල්වරට ඇති කිරීම
*B* - මහා විහාර සීමාව තුළ ජේතවන විහාරය කරවා සාගලික නිකායට පැවරීම
*C* - ක්‍රි.ව. 1891 දී මහාබෝධි සමාගම පිහිටුවීම සඳහා පුරෝගාමී වීම
*D* - ''ආසියාවේ රිදී සීනුව'' යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලැබීම (ලකුණු 04යි)

- **දී ඇති පින්තූර අධ්‍යයනය කොට, පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු, පිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.**



**(ii)** 1. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?
2. එය පිහිටා ඇති උයනේ නම කුමක් ද?
3. මෙය කුමන යුගයකට අයත්වේ ද?
4. කලාකරුවා මෙම නිර්මාණය තුළින් විදහා දැක්වීමට උත්සාහ කළ බුදුගුණ මොනවා ද?

(ලකුණු 04යි)



**(iii)** 1. මෙම රූපයෙන් දැක්වෙන නිර්මාණයේ නම කුමක් ද?
2. නිර්මාණය කළ පුද්ගලයාගේ නම කුමක් ද?
3. මෙම නිර්මාණයෙන් කලාකරුවා විදහා දැක්වීමට අදහස් කළ ගුණාංගය කුමක් ද?
4. කුමන මාධ්‍යයක් යොදාගෙන මෙය නිර්මාණය කර තිබේ ද?

(ලකුණු 04යි)

[2 වැනි පිටුව බලන්න

# II කොටස

**2.** **(i)** පහත සඳහන් ග්‍රන්ථ රචනා කළ කතුවරුන් පිළිවෙළින් නම් කරන්න.

*A* - ඉන්ඩිකා

*B* - නැචුරාලිස් හිස්ටෝරියා

*C* - ටොපෝ ග්‍රැෆියා ක්‍රිස්ටියානා (ලකුණු 03යි)

**(ii)** පහත සඳහන් සෙල්ලිපි අතරින්, ආරාම පාලනය හා වෙළෙඳාම පිළිබඳ තොරතුරු ඇතුළත් සෙල්ලිපි **දෙක** බැගින් වරහන් තුළින් තෝරා ලියන්න.
(බදුලු ටැම් ලිපිය, දෙවනගල ලිපිය, පෙරිමියන්කුලම ලිපිය, කළුදිය පොකුණු ලිපිය, ගල්පොත ලිපිය, මිහින්තලා පුවරු ලිපිය, තිරියාය ලිපිය) (ලකුණු 04යි)

**(iii)** සීගිරිය බලකොටුවෙහි වාස්තු විද්‍යාත්මක වැදගත්කම, ක්ෂේත්‍ර **දෙකක්** යටතේ පැහැදිලි කරන්න.
(2 1/2 × 2 බැගින් ලකුණු 05යි)

**(iv)** ඉතිහාසය විෂය හදාරන්නෙකුට නාණක මූලාශ්‍රවලින් **ලබා ගත හැකි ප්‍රයෝජන තුනක්** පැහැදිලි කරන්න.
(ලකුණු 06යි)

**3.** **(i)** පහත දැක්වෙන සිද්ධි හා සම්බන්ධ රජවරුන්ගේ නම් පිළිවෙළින් සඳහන් කරන්න.

*A* - මෙරට ක්ෂත්‍රිය අභිෂේක මංගල්‍යයේ ආරම්භය

*B* - ලම්බකර්ණ වංශයේ ප්‍රථම රජු

*C* - අනුරාධපුර රාජ්‍යයේ අවසන් රජු (ලකුණු 03යි)

**(ii)** වලගම්බා රජ සමයේ සිදු වූ වැදගත්, ආගමික සිදුවීම් **දෙකක්** හා දේශපාලන සිදුවීම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

**(iii)** පළමුවන විජයබාහු රජතුමාගේ විදේශ සම්බන්ධතා කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 05යි)

**(iv)** ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය බවට පත් කිරීමට පළමුවැනි පරාක්‍රමබාහු රජතුමා අනුගමනය කළ ක්‍රියාමාර්ග **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

**4.** **(i)** පහත දී ඇති ගංගාවලින් පෝෂණය වන වැව්, වරහන් තුළින් තෝරා ලියන්න.

*A* - මල්වතු ඔය

*B* - කනදරා ඔය

*C* - මී ඔය

(යෝධ වැව, මහගල් කඩවල වැව, පදවිය වැව, මහවිලච්චිය වැව, තබ්බෝව වැව, කවුඩුල්ල වැව)
(ලකුණු 03යි)

**(ii)** පහත සඳහන් කාර්යයන් ඉටුකර ගැනීම සඳහා නිර්මාණය කර තිබූ වැවෙහි අංග පිළිවෙළින් නම් කරන්න.

*A* - වැව් බැම්ම සේදී යෑම වැළැක්වීම

*B* - වැවේ අතිරික්ත ජලය පිට කිරීම

*C* - වැවකින් ජලය පිට කිරීමේ දී වැව් බැම්මට සිදුවන පීඩනය පාලනය කිරීම

*D* - ඇළ මාර්ග දිගේ වැවට ගලා එන ජලයේ අඩංගු රොන්මඩ රඳවා ගැනීම (ලකුණු 04යි)

**(iii)** පැරැන්නන් වාරි මාර්ග ඉදි කිරීමේ දී භූ විෂමතාව ප්‍රයෝජනයට ගත් ආකාරය උදාහරණ **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05යි)

**(iv)** ජලාශ්‍රිත ශිෂ්ටාචාර සමයේ පැවති ආර්ථික රටාව

- ⋆ වෙළෙඳාම
- ⋆ කෘෂිකර්මය
- ⋆ කර්මාන්ත

යන ක්ෂේත්‍ර යටතේ පැහැදිලි කරන්න.
(ලකුණු 06යි)

**5.** **(i)** පහත සඳහන් දේශපාලන සංසිද්ධි හා බැඳුණු රාජධානි පිළිවෙළින් නම් කරන්න.

*A* - ආර්ය චක්‍රවර්ති නම් ඇමතිවරයා දළඳා වහන්සේ රැගෙන යාම

*B* - ''සිංහල සංගය'' නම් කැරැල්ල

*C* - කැලිකට් හි සැමොරින්ගෙන් උදව් ලබා ගැනීම (ලකුණු 03යි)

**(ii)** පහත *A, B,C* හා *D* වලින් දැක්වෙන්නේ සිංහල හා පෘතුගීසි ජාතිකයන් අතර ඇති වූ සටන් කිහිපයක නායකයින් ය. එම සටන් ඇති වූ ස්ථාන පිළිවෙළින් නම් කරන්න.

*A* - ටිකිරි බණ්ඩාර කුමරු හා පෙරෙයිරා අපොන්සු ද ලසර්දා

*B* - පළමුවන විමලධර්මසූරිය රජු හා පේරෝ ලෝපෙස් ද සූසා

*C* - පළමුවන විමලධර්මසූරිය රජු හා දොන් ජෙරනිමෝ ද අසවේදු

*D* - දෙවන රාජසිංහ රජු හා දියෝගෝ ද මේලෝ ක්‍රැස්ටෝ (ලකුණු 04යි)

**(iii)** ලන්දේසීන් තම වෙළෙඳ බලය තහවුරු කර ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05යි)

**(iv)** ශ්‍රී ලංකාවට පැමිණි යුරෝපා ජාතීන්ට ක්‍රි.ව. 1815 වන තෙක්ම උඩරට රාජ්‍යය යටත් කර ගැනීමට නොහැකි වූ හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**6.** **(i)** පහත සඳහන් සිදුවීම් හා සම්බන්ධ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරු පිළිවෙළින් නම් කරන්න.

*A* - ගන්නොරුවේ පෞද්ගලික කෝපි වත්තක් පවත්වාගෙන යෑම

*B* - වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආරම්භ කිරීම

*C* - ධාන්‍ය බද්ද අවලංගු කිරීම (ලකුණු 03යි)

**(ii)** ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේ, දේශීය කෘෂිකර්මය පරිහානියට පත්වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

**(iii)** බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ මධ්‍යම පංතියක් බිහි වීමට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05යි)

**(iv)** ශ්‍රී ලංකාවේ බෞද්ධ පුනර්ජීවයක් ඇති කිරීමේ පුරෝගාමී වූ නායකයෙක් ලෙස හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමාගෙන් සිදු වූ සේවය නිදසුන් **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

## III කොටස

**7.** **(i)** *A* - ආර්ය ජනයාගේ මුල් බිම ලෙස සැලකෙන ප්‍රදේශය ද

*B* - මුල් ආර්ය ජනකොටස් ඉන්දියාවට ඇතුළු වූවායැ යි සැලකෙන දුර්ග මාර්ගය ද

*C* - ඉන්දියාවට පැමිණි ආර්යයන් මුලින් ම පදිංචි වූ ප්‍රදේශය ද

පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03යි)

**(ii)** පහත දැක්වෙන ඉන්දියාවේ රාජ්‍යයන්හි ශ්‍රේෂ්ඨතම යැයි සැලකෙන රජවරුන්ගේ නම් පිළිවෙළින් ලියා දක්වන්න.

*A* - මගධ

*B* - මෞර්ය

*C* - ගුප්ත

*D* - මෝගල් (ලකුණු 04යි)

**(iii)** මෞර්ය අධිරාජ්‍යය පරිහානියට පත්වීමට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05යි)

**(iv)** ඉස්ලාම් භක්තික පාලකයකු වුව ද ''මහා අක්බාර් රජුට ඉන්දියානු ජන සමාජයේ සුවිශේෂ ස්ථානයක් හිමි වේ.'' නිදසුන් **තුනක්** මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

[4 වැනි පිටුව බලන්න

**8.** **(i)** පහත *A, B* හා *C* යටතේ දක්වා ඇති ප්‍රකාශවලට අදාළ නායකයින්ගේ නම්, වරහන් තුළින් තෝරා ලියන්න.

*A* - චීනයේ ගම් මට්ටමින් සමුපකාර සංවිධාන පිහිටුවීමට මැදිහත් වීම

*B* - ඇතැම් ජපන් ඉතිහාසඥයින් පවසන පරිදි ජපන් ඉතිහාසයේ ස්වර්ණමය යුගයට පදනම දැමීම

*C* - ඉන්දියාවේ මධ්‍යම පංතියේ විසිත්ත කාමර දේශපාලනය පැල්පත් කරා ගෙන යාමට දායක වීම

(මහත්මා ගාන්ධි, මුත්සුහිතෝ, දඩාභායි නඖරෝජි, මා-ඕ-සේතුං, චෞ-එන්-ලායි, ටොකුගාවා ෂෝගුන්වරු)

(ලකුණු 03යි)

**(ii)** පහත *A, B, C* හා *D* යටතේ දක්වා ඇති සිද්ධීන් සඳහා අරමුණු වූ කරුණු **එක** බැගින් දක්වන්න.

*A* - සිපොයි හමුදා කැරැල්ල

*B* - චම්පා ප්‍රදේශයේ මහා සත්‍යග්‍රහය

*C* - දීර්ඝ පා ගමන

*D* - මහා ඉදිරි පිම්ම (ලකුණු 04යි)

**(iii)** ක්‍රි.ව. 1857 බ්‍රිතාන්‍ය විරෝධි ඉන්දියානු කැරැල්ල අසාර්ථක වීමට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න.

(ලකුණු 05යි)

**(iv)** බ්‍රිතාන්‍ය පාලකයන් විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති, ඔවුන් කෙරෙහි ඉන්දියානුවන් තුළ අප්‍රසාදයක් ඇති කිරීමට බලපෑ අයුරු කරුණු **දෙකක්** ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**9.** **(i)** පහත දැක්වෙන පුද්ගලයින්, පුනරුද සමයේ කුමන ක්ෂේත්‍රවල දියුණුව සඳහා කටයුතු කළේ ද?

*A* - රෆායල්

*B* - විලියම් හාවේ

*C* - විලියම් ෂේක්ස්පියර් (ලකුණු 03යි)

**(ii)** පුනරුද සමයේ සිදු වූ ආගමික ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

**(iii)** ''කුරුස යුද්ධය'' යුරෝපයේ වෙළෙඳාමට නව ආලෝකයක් වූ බව නිදසුන් **දෙකක්** යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

**(iv)** ''පුනරුදය'' යුරෝපා ජන සමාජයේ

- ⋆ සමාජ ක්‍රමය,
- ⋆ ආර්ථික ක්‍රමය,
- ⋆ ආගමික චින්තනය

යන ක්ෂේත්‍රවල වෙනසක් ඇති කිරීමට දායක වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**10.** **(i)** පහත දැක්වෙන ඓතිහාසික සිද්ධි හා සම්බන්ධ පුද්ගලයින්ගේ නම් පිළිවෙළින් ලියන්න.

*A* - ක්‍රි.ව. 1879 ඔස්ට්‍රියාව හා ජර්මනිය අතර යුධ ගිවිසුමක් ඇති කරගත් ජර්මන් නායකයා

*B* - පාප් වහන්සේ සමඟ ලැටරන් ගිවිසුම අත්සන් කළ ඉතාලි නායකයා

*C* - මැක් ආතර් සෙනෙවියා ඉදිරියේ යටත් වීමේ ලියවිල්ලට අත්සන් කළ ජපන් අධිරාජ්‍යයා (ලකුණු 03යි)

**(ii)** *A* - ක්‍රි.ව. 1914 සරයේවෝ සිද්ධියේ දී ඝාතනයට ලක් වූ ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරුගේ නම,

*B* - ඇමරිකා එක්සත් ජනපදය දෙවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වීමට හේතුව,

*C* - දෙවන ලෝක සංග්‍රාමයෙන් විනාශ වූ රටවල් නඟා සිටුවීම සඳහා ඇමරිකා එක්සත් ජනපදය, ඉදිරිපත් කළ වැඩපිළිවෙළ,

*D* - දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ලෝක සාමය ආරක්ෂා කිරීමට පිහිටුවන ලද ආයතනය

පිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 04යි)

**(iii)** ඇමරිකා එක්සත් ජනපදය ධනවාදී කඳවුරේ නායකත්වයට පත්වීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05යි)

**(iv)** ලෝක බල කඳවුරුවලට ගැති නොවී තම රටවල අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම සඳහා පිහිටුවා ගත් නොබැඳි ජාතීන්ගේ සංවිධානයේ ප්‍රතිපත්ති **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

***

අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

**1.** (අ) **(i)**



**1.** (ඈ) **(ii)**

